මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

**මාධ්‍ය නිවේදන අංක :PRE/2024/71** **2024.09.09**

**ජනාධිපතිවරණය - 2024 සැප්තැම්බර් 21**
**සියලුම වාහන හා ත්‍රී රෝද රථවල අලවා ඇති ස්ටිකර් ඉවත් කිරීම**

ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ ඡන්ද විමසීම ප්‍රකාශයට පත් කර ඇති හෙයින් මැතිවරණ නීති රීතිවලට අනුකූල නොවන අන්දමින් පෞද්ගලික බස් රථ, ත්‍රී රෝද රථ ඇතුළු පෞද්ගලික වාහනවල එක් එක් අපේක්ෂකයන්/ පක්ෂ ප්‍රවර්ධනය වන ආකාරයේ වැකි, සලකුණු, ඡායාරූප ඇතුළත් ස්ටිකර්, කොඩි ප්‍රදර්ශනය කිරීම පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාව වෙත පැමිණිලි ලැබී ඇත.

එවැනි ක්‍රියාවක් 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනතේ 74 වන වගන්තිය යටතේ වරදක් වන බැවින්, පෞද්ගලික බස් රථ, ත්‍රී රෝද රථ හා සෙසු පෞද්ගලික වාහනවල ස්ටිකර් අලවා තිබේනම් වහාම ඉවත් කිරීමට ක්‍රියා කළ යුතු ය.

පෞද්ගලික බස් රථ හා ත්‍රී රෝද රථ ඇතුළු සියලුම පෞද්ගලික වාහනවල අලවා ඇති ඉහත දැක්වූ වර්ගයේ ස්ටිකර් ගලවා ඉවත් කිරීමට සෑම පොලිස් බල ප්‍රදේශයක්ම ආවරණය වන ආකාරයේ හදිසි පරීක්ෂා කිරීම් සිදු කිරීමට ඒ ඒ නියෝජ්‍ය පොලිස්පතිවරු වෙත සහ කොට්ඨාස භාර පොලිස් නිලධාරීන් වෙත ද ඒ මගින් පොලිස් ස්ථානාධිපතිවරුන් වෙත ද අවශ්‍ය උපදෙස් කඩිනමින් නිකුත් කොට ඇති බව මෙයින් දන්වා සිටිමි.

**ආර්.එම්.ඒ.එල්.රත්නායක**
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)